# 1.19 හින්දී සහ සිංහල භාෂාවේ නාම පාදයෙහි අන්තර්ගත කෘදන්ත විශේෂණ පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

ඩබ්ලිව් නීතා සුභාෂිණී සෙනෙවිරත්න
තාවකාලික සහකාර කථිකාචාර්ය හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

වාග්විද්‍යා විෂයයෙහි එන වැදගත් මෙන්ම විස්තෘත අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස වාක්‍ය විචාරය හැඳින්විය හැකි ය. භාෂා විග්‍රහයෙහි ලැබෙන විශාල ම ව්‍යාකරණ ඒකකය වනුයේ වාක්‍යය යි. වාක්‍යයක් විවිධ ව්‍යාකරණ ඒකකවලින් සැදුම් ලද්දකි. වාක්‍ය විචාරාත්මක සිද්ධාන්තයන්ට අනුව කිසියම් වාක්‍යයක් රූපීය විග්‍රහයට ලක්කිරීමේදී එය ප්‍රධාන වශයෙන් 'නාම පාදය' සහ 'ක්‍රියා පාදය' ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

නාම පාදය මූලික වශයෙන් නිර්මාණය වනුයේ නාමපදයක් මුල්කොට ගෙන ය. නාම පාදයක් එක් නාමපදයකින් හෝ නාම පද කිහිපයකින් සමන්විත විය හැකි ය. නාම පාදය අන්තර් කේන්ද්‍රීය වන අතර නාමපදය එහි කේන්ද්‍රය වෙයි. නාම පාදයක නාමපද එකකට වඩා වැඩි ගණනක් තිබේ නම් ඒ සියල්ල ම එම පාදයෙහි කේන්ද්‍රය ලෙස සැලකේ. ඇතැම් විටෙක නාමපාදය නාම විශේෂණවලින් ද සමන්විත වේ. නාම පාදයෙහි අන්තර්ගත නාම විශේෂණ ගුණවාචී, පරිමාණවාචී, සංඛ්‍යාවාචී, සාර්වනාමික, සම්බන්ධවාචී සහ කෘදන්ත විශේෂණ ලෙස විවිධ අර්ථයෙන් භාවිතා වේ. මෙම නාම විශේෂණ අතුරින් නාම පාදයෙහි අන්තර්ගත කෘදන්ත විශේෂණ පිළිබඳ ව විමර්ශනයක් සිදු කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

හින්දී භාෂාවේ කෘදන්ත ප්‍රධාන වශයෙන් 'විකාරී කෘදන්ත' සහ 'අවිකාරී කෘදන්ත' ලෙස ප්‍රභේද දෙකකි. නාමපදයේ (විශේෂ්‍යයේ) ලිංග, වචන, විභක්ති යන ව්‍යාකරණමය ප්‍රවර්ගවලට අනුව රූපීය වෙනසකට භාජනය වන කෘදන්ත 'විකාරී කෘදන්ත' වන අතර නාමපදයේ (විශේෂ්‍යයේ) ලිංග, වචන, විභක්ති යන ව්‍යාකරණමය ප්‍රවර්ගවලට අනුව රූපීය වෙනසකට භාජනය නොවන කෘදන්ත 'අවිකාරී කෘදන්ත' වේ. මේ අතුරින් නාම විශේෂණයක් ලෙස යෙදෙනුයේ විකාරී කෘදන්තයි

එහෙත්, සිංහල භාෂාවේ කෘදන්ත නාම මූලික වශයෙන් බෙදා දක්වා ඇත්තේ කර්තෘ කාරක, කර්ම කාරක සහ භාව කාරක කෘදන්ත වශයෙනි.

හින්දී නාම පාදයෙහි කෘදන්ත විශේෂණ සම්බන්ධයෙන් දක්නට ලැබෙන උක්ත ලක්ෂණය සිංහල භාෂා නාම පාදයෙහි දක්නට නොලැබෙන හෙයින්, හින්දී භාෂාව හදාරන ආධුනික විද්‍යාර්ථීන්ට මෙය ගැටලු ඇති කරවන ව්‍යාකරණ ලක්ෂණයක් බවට පත් ව ඇත. මෙම විමර්ශනයෙන් එම ගැටලුව තුලනාත්මක ව අධ්‍යයනය කිරීමට අවකාශ සැලසේ.